# කෘෂිකර්ම ව්‍යාප්තියට නව ප්‍රවේශයක්,

## ගොවි ගැටළු විසඳුමට ගුවන් විදුලි අත්වැලක්

## "අස්වැන්න ශ්‍රාවක සමාජය"

ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම සංවර්ධනය වේගවත් කිරීමේදී කෘෂි කර්මාන්තයේ නියැලෙන ජනතාවගේ කෘෂිකාර්මික දැනුම වැඩි කිරීමත්, ඔවුන්ගේ ආකල්ප වෙනස් කරමින් නිපුනතා සංවර්ධනය කර ගැනීමත්, කෘෂිකර්ම ව්‍යාප්ති සේවාවට පැවරෙන මූලික වගකීමකි. මෙම අරමුණ සපුරා ගැනීමට විවිධ ව්‍යාප්ති ක්‍රමවේද අනුගමනය කිරීමට මධ්‍යම රජයේ සහ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු උත්සාහයක යෙදී සිටී.

21 වැනි සියවස තුළ මාධ්‍ය ක්ෂේත්‍රය සිය ආධිපත්‍ය පතුරවමින් විශ්ව ගම්මාන සංකල්ප වැනි දැවැන්ත ව්‍යාපාර හඳුන්වා දෙමින්, වෙනත් සියළු බලවේග වසඟයට ගැනීමට උත්සාහ ගන්නා බව අපට දක්නට ලැබෙන සත්‍යයකි. මෙවැනි වකවානුවක ඉහත සඳහන් අරමුණු ඉටුකර ගැනීමටත්, කෘෂිකර්ම ව්‍යාප්ති කටයුතු ශක්තිමත් කිරීමටත්, මෙම ප්‍රබල මාධ්‍යයන් යොදා ගැනීම අප හමුවේ ඇති අභියෝගයකි.

මෙම මාධ්‍යයන් අතරින්, ජනතාවට වඩාත් සමීප බහුලව භාවිතා වන ගුවන් විදුලියටද සැලකිය යුතු කාර්ය භාරයක් පැවරේ. නිවෙස් වල මෙන්ම ව්‍යාපාර ස්ථානවල, ගොවිපලවල සහ යාන වාහනවල් ඇතුළු මුළු සංඛ්‍යාව මිලියන දෙකකට ආසන්න ගුවන් විදුලි යන්ත්‍ර ප්‍රමාණයක් ශ්‍රී ලංකාව තුල තිබෙන බව දැන ගන්නට ඇත.

ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් 70% ක ප්‍රතිශතයක් ග්‍රාමීය වන අතර, ඔවුන්ගෙන් වැඩි ප්‍රමාණයක් කෘෂි කර්මාන්තය ජීවනෝපාය කරගෙන සිටී. එම අයගේ කෘෂිකාර්මික දැනුම හා හුරුව වැඩි දියුණු කිරීමත්, ආකල්ප වෙනස් කිරීමේ ව්‍යාප්ති කාර්ය ශක්තිමත් කිරීමේ අරමුණින් රූපවාහිණී හා ගුවන් විදුලි ගොවි සේවාව විවිධ වැඩ සටහන් සම්පාදනය කරනු

**පී.සී. අතපත්තු, ඒකක භාර නිලධාරී.**
**චන්දන ප්‍රේමසිංහ, කෘෂිකර්ම උපදේශක.**
**ගුවන් විදුලි ගොවි සේවාව, (මහනුවර ඒකකය)**
**ව්‍යාප්ති හා පුහුණු අංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**
**පේරාදෙණිය.**

ලබයි. මෙම ගුවන් විදුලි ගොවි සේවාවේ මහනුවර ඒකකයේ ක්‍රියාත්මක කරන"අස්වැන්න" කෘෂි සංවාදයද, එවැනිම වැඩ සටහනකි. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ කඳුරට සේවය ඔස්සේ සෑම සිකුරාදම පෙ.ව. 8.30 සිට පෙ.ව. 9.00 දක්වා විකාශනය කරන මෙම සංවාදය තුලින් කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළව ජනනය වන නව ක්‍රමවේද, බීජ හා රෝපණ ද්‍රව්‍ය ඇතුළු තාක්ෂණයන් පිළිබඳව පර්යේෂණ

නිලධාරීන්. ව්‍යාප්ති නිලධාරීන්, ගොවි ජනතාවද සම්බන්ධ කර සජීවීව කෙරෙන සාකච්ඡා සභාවේ වේදිකාවක් විය.

වසර තුනකට වැඩි කාලයක් විකාශනය කල මෙම අස්වැන්න වැඩ සටහනට ප්‍රතිචාර ලෙස අසන්නන්ගෙන් නොයෙක් ගැටළු වරින් වර ඉදිරිපත් වන අතර. මෙයින් සමහරක් මූලික කෘෂිකාර්මික ගැටළු වන අතර. තවත් සමහරක් සාකච්ඡා කරන මාතෘකාවට පරිබාහිරවූ ගැටළු විය. මෙම පරස්පර තත්ත්වය කුමක්දැයි වටහා ගැනීමේ කුතුහලයක්ද, වැඩ සටහන් සම්පාදකවරුන් වන අප හට නිතැතින්ම ජනිත කර විය. මෙම ගැටළු විසඳීමේ උපාය මාර්ගයක් ලෙසත්, ශ්‍රාවක ජන්තාවගේ ප්‍රතිචාරය හඳුනා ගෙන ඔවුන්ගේ සක්‍රිය දයකත්වය ලබා ගැනීමේ යාන්ත්‍රණයක් ලෙසත්, ශ්‍රාවක සමාජයක් ඇති කිරීමට අප කල යෝජනාවට සවන් දෙන පිරිසගේ ක්ෂණික හා ඉහල ප්‍රතිචාරයක් ලැබීම තුලින් අස්වැන්න ශ්‍රාවක සමාජය බිහි කිරීමට හැකිවිය. අප හා සංවිධාන ගත වන සාමාජිකයින් ඔවුන්ගේ අවශ්‍යතාවයද නිරන්තරව ඉදිරිපත් කරන්නට පෙළඹුණි. ඒ අතර අපේ සම්ප්‍රදයක ගමන්මඟ වෙනස් කිරීමටත්, ඔවුන්ට අවශ්‍ය තාක්ෂණයන් වැඩි වැඩියෙන් ලබා දීමටත්, අප මෙහෙයවීමට මඟ සැලසුණි.

මෙම ශ්‍රාවක සමාජය ආරම්භ කර දැනට මාස 5 ක පමණ කාළයක් තුල සාමාජිකත්වය 200 කට ආසන්න වන අතර, කඳුරට ගුවන් විදුලියේ ශ්‍රවන කලාපයට අයත් විවිධ දිස්ත්‍රික්ක වල විවිධ වයස් කාණ්ඩවල මිශ්‍ර කණ්ඩායමක් මෙම ශ්‍රාවක සමාජයට ඇතුලත් වී ඇත. මෙම අය ගෙවතු වගාව ඇතුළු කෘෂිකාර්මික ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය දැනුම හා පුහුණුව ලබා ගැනීමටත්, උසස් රෝපණ ද්‍රව්‍ය ඇතුළු යෙදවුම් ලබා ගැනීමටත්. කෘෂිකර්ම දෙපාතීමේන්තුවේ උදව්ව බලාපොරොත්තු වේ.

මෙම අපේක්ෂාවන් ගෙන් කොටසක් හෝ ඉටු කිරීමට අප උත්සාහ කළෙමු. පළමුවන ක්ෂේත්‍ර ක්‍රියාකාරකම ලෙස 2005 ඔක්තෝබර් 23 වෙනි දින පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේදී ගෙවතු අලංකරණය, ඇන්තූරියම් වගාව හා ඕකිඩ් වගාව පිළිබඳ න්‍යායික හා ප්‍රායෝගික පුහුණු වැඩමුළුවක් පැවැත්විය. මෙම පුහුණුවට සාමාජිකයින් 50 සහභාගි කරවීමට බලාපොරොත්තු වුවත් 76 දෙනෙකු පමණ සහභාගි විය. ඔවුන් ඉතා ඕනෑකමින් පුහුණුව තුල රැඳී සිට එල ප්‍රයෝජන ගැනීමට උනන්දුවක් දැක්වීමෙන් අප වඩාත් දිරිමත් කෙරුණි. මෙම කාර්ය සාර්ථක වීමට පේරාදෙණිය උද්භිද උද්‍යානයේ උද්‍යාන අධිකාරි ලාල් ජයරත්න මහතා ඇතුළු පුහුණු කාර්ය මණ්ඩලය ලබාදුන් සහාය ප්‍රශංසනියයි.

මෙදින වඩාත් විශේෂත්වය වුයේ කට හඬින් පමණක් දැන සිටි ශ්‍රාවක ජනතාව සහ කඳුරට ගුවන් විදුලි නිවේදක සමන් ජයරත්න සහ ගුවන් විදුලි ගොවි සේවාවේ අප සැම එකිනෙකා හඳුනා ගැනීමට

ලැබීමයි. තවද මෙම වැඩමුළුවට සහභාගි වූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරි මණ්ඩලයද ඔවුන්ට හඳුන්වා දීමට හැකි විය.

දෙවැනි ක්‍රියාකාරකම ලෙස 2005.11.11 වෙනි දින උද්භිද උද්‍යානයේම විසිතුරු පැල වගාව පිළිබඳව පුහුණු පන්තියට "අස්වැන්න" ශ්‍රාවක සාමාජිකයින් 60 ක් පමණ සහභාගි විය. මෙම න්‍යායික හා ප්‍රායෝගික පුහුණුවට ඉතා උනන්දුවෙන් සම්බන්ධවීම අපගේ බලවත් සතුටට හේතු විය.

තුන්වැනි මෙන්ම උත්කර්ශවත් ක්‍රියාකාරකම ලෙස "සාර්ථක ගෙවත්තක් සකසා ගැනීමේ" වැඩමුළුව හා 2005 දෙසැම්බර් 02 වැනි දින ගන්නෝරුව සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේදී පැවැත්විණි. න්‍යායික දැනුමත්, ගන්නොරුව ආදශී ගෙවත්තේදී ප්‍රායෝගික අවබෝධයත් ලබා දෙන ලදී. උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ පර්යේෂණ නිලධාරි උදය ද සිල්වා මහතා මනා කැපවීමෙන් යුක්තව මෙම කාර්යයට සම්පත්දායකත්වය සපයන ලද අතර, ගෙවතු සැළසුම්කරණය හා කළමනාකරණය ඇතුළු තොරතුරු පිළිබඳ මනා දැනීමක් ලබාදී අවසානයේදී ගෙවත්තට අත්‍යාවශ්‍ය බෝග 15 ක් අඩංගු බීජ කට්ටලයක් සහ උපදෙස් පත්‍රිකාවක්ද සහභාගිවූ සියළුම දෙනාට ලබාදීමට හැකිවිය. මෙම වැඩමුළුවේ ආරම්භක උත්සවය කෘෂිකර්ම අධ්‍යක්‍ෂ ජනරාල් ආචාර්ය සී. කුඩාගමගේ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ අතර, උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ අධ්‍යක්‍ෂිකා ආචාර්ය පිනාදරි ද සොයිසා මහත්මිය, ව්‍යාප්ති හා පුහුණු අංශයේ අධ්‍යක්‍ෂ ගාමිණී සමරසිංහ මහතා, නියෝජ්‍ය අධ්‍යක්‍ෂ කේ.එන්. මාන්කෝට්ටේ මහතා සහ ගුවන් විදුලි ගොවි සේවාවේ සහකාර අධ්‍යක්‍ෂ පර්සි වීරක්කොඩි මහතා ඇතුළු නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් සිදු කෙරුණි. මෙම වැඩමුළුවට අස්වැන්න ශ්‍රාවකයින් 130 ක් පමණ වඩාත් සමීප වූ ඥාති පිරිසක් මෙන් ඉතා උනන්දුවෙන් සහභාගි වූ අතර, මෙම අය තම ගෙවත්තෙන් කිසියම් බෝගයක් වගාකර ප්‍රයෝජනයට ගැනීමට දැඩි අධිෂ්ඨානයෙන් යුක්තව වැඩමුළුව අවසානයේ නික්ම යනු අපට දක්නට ලැබුණි. එසේම මෙම කාර්ය කෘෂිකර්ම අධ්‍යක්‍ෂ ජනරාල්වරයා ඇතුළු නිලධාරි මණ්ඩලයේ විශේෂ ප්‍රශංසාවටද ලක්වීම අපගේ බලවත් සතුටට හේතු වූ අතර, එදින "අස්වැන්න ශ්‍රාවක සමාජය" කලඑලි දැක්වීම සිදු කෙරුණි.

2005 දෙසැම්බර් මස 20 - 21 දිනවල කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල භූමියේ පැවැති සල්පිලට අප සාමාජිකයින් තිදෙනෙකු සම්බන්ධකර විසිතුරු පැල අලෙවි කුටියක් පවත්වා ගැනීමට ඉඩකඩ සැලසීමට හැකිවූ අතර, ඔවුන් සතුටුදායක ආදායමක් උපයා ගන්නා ලදී.

දෙළොස්බාගේ ශ්‍රාවකයින් පිරිසකට මධ්‍යම පළාත් සභාවේ ව්‍යාප්ති අංශය එකතුව මීමැසි පාලනය පිළිබඳ පුහුණුවක් ලබාදීමට හැකිවිය. එහි සම්පත්දායකත්වය කෘෂිකර්ම උපදේශිකා එච්.එම්.එම්. ධනරංජනි

මහත්මිය සපයන ලදී. 2006.02.14 වන දින මැණික්හින්න ගොවිජන සෙවා මධ්‍යස්ථානයේදී අපේ ශ්‍රාවක කණ්ඩායමකට සහ පළාත් කෘෂිකර්ම ව්‍යාප්ති කාර්ය මණ්ඩලයේ කොටසකට පලතුරු ඉදවීමට එත්‍රල් භාවිතය පිළිබඳ ක්‍රම ආදර්ශන වැඩමුළුවක් පර්යේෂණ නිලධාරි ආචාර්ය කේ.ඒ. සාරානන්ද මහතාගේ සම්පත් දායකත්වයෙන් සිදු කෙරිණි.

ආසන්නතම ක්‍රියාකාරකම ලෙස මෙම මාර්තු මස 2 වෙනි දින ගන්නෝරුව සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේදී මීමැසි පාලනය පිළිබඳ ප්‍රායෝගික පුහුණු පන්තියක් ශ්‍රාවකයින් 45 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පැවැත්වීමට හැකි විය. මෙම පුහුණු පන්තිය සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ එස්.කේ. යසකේතු මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ අතර, මෙම කාර්යයට කෘෂිකර්ම උපදේශක එච්.එම්.එම්. ධනරංජනි මහත්මිය සහ කෘෂිකර්ම උපදේශක කුලසේකර මහතාගේ සම්පත්දායකත්වය නොමඳව ලැබුණි. මීමැසි පෙට්ටි සහ ජනපද ඉල්ලමින් කෘෂි ප්‍රකාශන මිලදී ගනිමින් ශ්‍රාවක ප්‍රතිචාරය පෙන්නුම් කිරීම අපගේ සතුටට හේතු විය.

මෙම වැඩ සටහන් වලින් පසුව තම අසල්වැසියන්ද මෙම සමාජයට යොමු කරමින් විශේෂ උනන්දුවකින් ක්‍රියාකරන සාමාජිකත්වය අපගේ අස්වැන්න කෘෂි සංවාදයට ඉහළ ප්‍රතිචාරයක් දක්වමින් සිටී. වර්තමාන සාමාජිකත්වය 200 ක් පමණ වන අතර, සතිපතා එය වැඩිවෙමින් පවතී. ඉදිරියටත් ක්ෂේත්‍ර දින, වැඩමුළු, පුහුණු පංති, ක්‍රම ආදර්ශන ඇතුළු විවිධ ක්‍රියාකාරකම් තුළින් අපගේ මෙහෙවර පුළුල් කර නොනවතින ගමනකට පා නැගීමට අප සැළසුම් කරන බව සතුටින් සඳහන් කරමු.

ගොවි පවුල්වල ජීවන තත්ත්වය අල්ප මාත්‍රයකින් හෝ ඉහළ දැමීමටත්, ඒ තුලින් රටේ කෘෂිකර්ම සංවර්ධනය වේගවත් කිරීමේ ක්‍රියාවලියට සක්‍රියව දායකවීමටත්. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සම්පත් වලින් ගොවි ජනතාවට ඵල නෙලීමට හැකිවන සම්බන්ධීකරණයක් ලබාදී ගොවි ගැටළු විසඳ ගැනීමට අත්වැලක් වීමටත් අප ඇප කැප වීමට සනිටුහන් කර ගත්තෙමු.

මේ සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නිලධාරි මණ්ඩලයේ මඟ පෙන්වීමත්, කඳුරට ගුවන් විදුලියේ නොමසුරු සහයෝගයත්, ශ්‍රාවක ජනතාවගේ දැඩි උනන්දුවත් ඉතාමත් අත්‍යාවශ්‍ය වන අතර, එය නොඅඩුව ලැබෙනු ඇතැයි අප විශ්වාස කරමු. විශේෂයෙන්ම අසල්වැසි සහෝදර ජනතාවද මෙහි සාමාජිකත්වය ලබා ගැනීමට නැඹුරු කර ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ දැමීමට උදව් කිරීමේ මහඟු පින්කමට දායකවීම සාමාජිකත්වයේ පරම යුතුකම බව සිහිපත් කරමු. විශේෂයෙන්ම ව්‍යාප්ති හා පුහුණු අංශයේ අධ්‍යක්ෂ ගාමිණී සමරසිංහ මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ කේ.එන්. මාන්කෝට්ටේ මහතා සහ ගුවන් විදුලි ගොවි සේවාව භාර සහකාර අධ්‍යක්ෂ පර්සි වීරක්කොඩි මහතාගේ මඟ පෙන්වීමත්, කඳුරට ගුවන් විදුලියේ කාර්ය මණ්ඩලයෙන් ලැබෙන සහයෝගයත් ඉතා අගය කරමු.